සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

12 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අදින්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.

---

01. බල කේන්ද්‍රණය යනු,

(1) බලය ඒකරාශී වීමයි. (2) බලය විතැන් වීමයි.
(3) බලය විමධ්‍යගත වීමයි. (4) බලය පැතිරීමයි.
(5) බලය පාලනය කිරීමයි.

02. ඥාන ගවේෂණය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) දැනුම ලබා දීමයි.
(2) දැනුම සොයා යෑමයි.
(3) ප්‍රාථමික සමාජයන්හි දක්නට ලැබුණු ක්‍රියාවලියයි.
(4) නූතන සමාජයන්හි දැකිය හැකි ක්‍රියාවලියකි.
(5) අනාගතය උපකල්පනය කිරීමේ සංකල්පයකි.

03. සංජානන ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථා වන්නේ,

(1) තෝරා ගැනීම, පරිකල්පනය හා භාවිතයයි.
(2) ප්‍රතිභාව, පරිකල්පනය හා සංවිධානයයි.
(3) හැඟීම්, සිතුවිලි හා චර්යාවයි.
(4) තෝරා ගැනීම, සංවිධානය හා අර්ථ දැක්වීමයි.
(5) පාලනය, තුලනය හා විමර්ෂණයයි.

04. සමාජයක වටිනාම සම්පත,

(1) ප්‍රාග්ධනයයි (2) ශ්‍රම සම්පතයි (3) මානව සම්පතයි
(4) ඛණිජ සම්පතයි (5) පවුලයි

05. ස්වදේශීය චින්තනය ගොඩනැගී ඇත්තේ,

(1) ජනමත නායකයින්ගේ චින්තනයන් මතය (2) ආගමික චින්තනයන් මතය
(3) සංස්කෘතිය මතය (4) ආගම හා කලාව මතය
(5) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය මතය

06. ඔබ නිල ඇඳුමින් සැරසී උදෑසන පාසලට එන අතර දන්නා හඳුනන අයෙක් ''පාසල් යනවා දැයි'' ඔබගෙන් අසයි. මෙහි සන්නිවේදන අරමුණ වන්නේ,

(1) පෙළඹවීම (2) තොරතුරු ලබාගැනීම (3) අධ්‍යාපන කාර්යය
(4) සහවේදනය (5) හොඳ හිත පවත්වාගෙන යාමයි.

07. සන්නිවේදනය නිසිමාර්ගයේ පවත්වාගෙන යාම,

(1) සන්නිවේදන නියාමනයයි (2) සන්නිවේදන භාවිතයයි
(3) සන්නිවේදන ක්‍රියාවලියයි (4) සාර සන්නිවේදනයයි
(5) සංවර්ධන සන්නිවේදනයයි

08. ගමක පොදු ළිඳ අසලට පැමිණෙන පිරිසක් අතර සිදු කෙරෙන සුහද කතාබහ,

(1) විධිමත් සන්නිවේදනයයි
(2) අවිධිමත් පුද්ගලාන්තර සන්නිවේදනයයි
(3) අවිධිමත් සමූහ සන්නිවේදනයයි
(4) විධිමත් පුද්ගලාන්තර සන්නිවේදනයයි
(5) සාම්ප්‍රදායික සන්නිවේදනයයි.

09. ඥාති සම්බන්ධතා, මිත්‍රත්වය, සුහදතාව ආදී සමාජ සංසිද්ධීන්,

(1) සංජානනය මත පදනම් වේ.
(2) නියාමනය මත පදනම් වේ.
(3) සන්නිවේදනය මත පදනම් වේ.
(4) ප්‍රතිෂ්ඨාපනය මත පදනම් වේ.
(5) සහජාඨයන් මත පදනම් වේ.

10. තමන් අයත් සමාජය අපේක්ෂා කරන ආකාරයට හැසිරීමට ඉගෙන ගැනීම,

(1) සමාණාවබෝධය
(2) සමාජානුයෝජනය
(3) සංස්කෘතිය
(4) අධ්‍යාත්මික ගුණ වගාව
(5) සදාචාරය

11. කිසියම් පුද්ගලයෙකු ඉතා ළඟින් ඇසුරු කිරීමෙන් ඔහු සතු ගුණාංග තමන් වෙත පවරා ගැනීම,

(1) ආත්ම කේන්ද්‍රණය
(2) සමාජගත වීමය
(3) තදාත්මීය කරණයයි
(4) අනුකරණයයි.
(5) අනුගමනයයි

12. තොරතුරු සම්පාදනය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න

(1) විවිධ මාධ්‍ය ඔස්සේ ජනතාවට තොරතුරු ලැබේ.
(2) විධිමත් මෙන්ම අවිධිමත් මාධ්‍යයෙන් ද තොරතුරු ලබාගත හැක.
(3) තොරතුරක අවශ්‍යම ලක්ෂණය විශ්වාසනීයත්වයයි.
(4) අවිධිමත් මාධ්‍ය මඟින් ලැබෙන තොරතුරු විශ්වාසනීයත්වයෙන් තොරය.
(5) නිවැරදි තොරතුරු මූලාශ්‍ර කෙරෙහි ජනතාව උනන්දු වීම වැදගත්ය.

13. සමාජයක මූලික ස්වභාවය තීරණය කරන අංශ දෙක වන්නේ,

(1) ව්‍යවසාය මූල හා කාර්මික මූල
(2) කාර්මික මූල හා ප්‍රජා මූල
(3) ආර්ථික මූල හා ප්‍රජා මූල
(4) ප්‍රජා මූල සහ ව්‍යවසාය මූල
(5) ප්‍රජා මූල සහ සේවා මූල

14. මොළයේ වම්පස ක්‍රියාකාරිත්වය සඳහා අදාළ වන හැකියාවන් වන්නේ,

(1) කථනය, නිර්මාණශීලී බව, වර්ණ, ඇගයුම
(2) තර්ක, විචාරය, ලිවීම, අනුපිළිවෙල
(3) කියවීම, අවබෝධය, ඇගයුම, මුහුණේ ඉරියව්
(4) ප්‍රතිරූප වර්ණ, පටිපාටිගත කිරීම, ලිවීම
(5) සාකල්‍ය හැකියාව, කථනය, ඇගයුම, මුහුණේ ඉරියව්

15. දොරටුපාල සංකල්පය හඳුන්වා දෙනු ලැබුවේ,

(1) එඩ්වඩ් ෆැපීර්
(2) පෝල් ලසාස්ෆීල්ඩ්
(3) හැරල්ඩ් ලැස්වෙල්
(4) ඩේවිඩ් කේ. බර්ලෝ
(5) විල්බර් ශ්‍රාම්

16. ගෝලීයකරණය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ගෝලීයකරණයට තවත් අනුපාත ව්‍යවහාර රැසකි.
(2) මෙයට පිළිගත් පොදු න්‍යායයක් නැත.
(3) ගෝලීයකරණය බහුමානීය හා බහුවිෂයයික සංකල්පයකි.
(4) ගෝලීයකරණය බටහිර රටවලට සීමා වූ සංකල්පයකි.
(5) නව ලිබරල් වාදී සංකල්පයකි.

The National e-learning Portal for The General Education

17. සන්නිවේදන ක්‍රියාවලිය යාන්ත්‍රික පදනමකින් යුතුව විග්‍රහ කරන ලද්දේ,

(1) ෆැනොන් වීවර් (2) හැරල්ඩ් ලැස්වෙල් (3) ඩේවිඩ් කේ. බර්ලෝ
(4) ෂවරට් එම්. රෙන්ර්ස් (5) ලූෂන් පායි

18. සන්නිවේදනයෙන් සිදු කරන වැදගත්ම සමාජ මෙහෙවර නම්,

(1) ප්‍රජාව අතර අන්තර් සබඳතා ගොඩනැගීම.
(2) ග්‍රාහකයා වෙත බලපෑම් එල්ල කිරීම.
(3) ගෘහස්ථව පරිහරණය කරන මාධ්‍යයක් වීම.
(4) වෙළඳ ප්‍රචාරණය සිදු කිරීම.
(5) රැකියා අවස්ථා සම්පාදනය කිරීම.

19. ජනමාධ්‍ය විසරණය හේතුවෙන් ලෝකය තුළ විශ්ව ගම්මානයක් ගොඩනැගෙන බව ප්‍රකාශ කළේ,

(1) ඉතියල් ද සොලා පුල් (2) ඩැනියල් ලර්නර් (3) ග්‍රාම් බස්ගුඩ්
(4) මාෂල් මැක්ලූහන් (5) එඩ්වඩ් ටයිලර්

20. ජනමාධ්‍ය වලට අදාළ ප්‍රතිපත්ති හා නීති සකස් කිරීමට ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් කමිටුවක් පත් කළේ නම් එහි දක්නට නොලැබෙන සන්නිවේදන විධි ක්‍රමය වන්නේ,

(1) ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම (2) විධිමත් කණ්ඩායම
(3) අවිධිමත් කණ්ඩායම (4) ක්‍රියාකාරි කණ්ඩායම
(5) සමූහ සන්නිවේදනය

21. ජනමාධ්‍ය තොරතුරු වල දැකිය හැකි කැපී පෙනෙන ගුණාංගය වන්නේ,

(1) දෛනිකත්වය (2) සංකීර්ණත්වය (3) විවිධත්වය (4) විචාරශීලීත්වය
(5) ආක්‍රමණශීලිත්වය

22. ගුරුතුමා විදේශීය භාෂාවකින් දුන් උපදෙස් අවබෝධ කර ගැනීමට ගත් උත්සාහයේ දී ශිෂ්‍යයා තුළ සිදු වන්නේ,

(1) ආකේතීකරණය (2) විකේතීකරණය (3) ප්‍රතිනිර්මාණය (4) පරිවර්තනය
(5) විකේතකරණය

23. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යනු,

(1) සන්නිවේදන සබඳතාවේ මට්ටම දක්වන්නකි.
(2) සීමිත පිරිසක් සමඟ දක්වන අන්තර් සම්බන්ධතාවයකි.
(3) ග්‍රාහකයින් දැනුවත් කිරීමේ හා පෙළඹවීමේ සන්නිවේදන විධි ක්‍රමයකි.
(4) එකම පුද්ගලයෙකු තුළ සිදුවන සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරුවකි.
(5) ප්‍රතිපෝෂණයක් බලාපොරොත්තුවෙන් සිදුකරන තොරතුරු ලබා දීමකි.

24. මිනිසා සිය දෛනික කටයුතු සඳහා භාවිතා කරන්නේ,

(1) ප්‍රාදේශීය භාෂාවයි (2) ජීව භාෂාවයි (3) මාතෘ භාෂාවයි
(4) උප භාෂාවයි (5) ජාතික භාෂාවයි

25. රූපවාහිනී මාධ්‍ය තුළ ප්‍රධාන සන්නිවේදන ප්‍රකාශන රටාව වන්නේ,

(1) විවරණය හා කථන ක්‍රමයයි (2) ලේඛණය හා රූපණ ක්‍රමයයි
(3) රූපණ හා කථන ක්‍රමයයි (4) ශ්‍රවණ හා විවරණ ක්‍රමයයි
(5) ශ්‍රවණ හා ලේඛන ක්‍රමයයි

26. නිවසකට ඇතුල්වීමට උත්සාහ කරන සොරකු, බල්ලකු බිරීම නිසා හඳුනාගැනීමට ගෙහිමියාට ඉවහල් වූ සන්නිවේදන ස්වරූපවල අනුපිළිවෙල වන්නේ,

(1) ශ්‍රව්‍ය හා අවිධිමත් සන්නිවේදනය (2) වාචික හා නිර්වාචික සන්නිවේදනය
(3) නිර්වාචික හා වාචික සන්නිවේදනය (4) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය
(5) දෘශ්‍ය හා ශ්‍රව්‍ය සන්නිවේදනය

The National e-learning Portal for The General Education

27. විශාල සම්මන්ත්‍රණ ශාලාවක දේශනයකට පැමිණෙන කථිකයාට තම පහසුව සඳහා සන්නිවේදන උපකරණ අවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන් ම අවශ්‍ය වන්නේ,
   (1) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ උපකරණ
   (2) උඩිස් ප්‍රක්ෂේපණ උපකරණ
   (3) ශබ්ද විකාශන උපකරණ
   (4) රැහැන් රහිත මයික්‍රෆෝනය
   (5) විනිවිදක ප්‍රක්ෂේපණ උපකරණ
28. නිවසේ අඹ ගසේ ඉදුණු අඹ රසක් තිබෙනු දුටු කමල්ට අඹ කෑමට සිත් විය. ඔහු තම සොහොයුරාට අඹ කැඩීමට වියළි පොල්ලක් රැගෙන එන්නැයි පැවසුවේය. මෙහි දක්නට ලැබෙන්නේ,
   (1) පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදනයයි.
   (2) අන්තර්වර්ති හා සමූහ සන්නිවේදනයයි.
   (3) ස්වයං සන්නිවේදනය හා අන්තර්වර්ති සන්නිවේදනයයි.
   (4) අන්තර්වර්ති හා පුද්ගලාන්තර සන්නිවේදනයයි.
   (5) සමූහ සන්නිවේදනය සහ ජන සන්නිවේදනයයි.
29. පූර්ව මැතිවරණ අවස්ථාවක දී ජනමාධ්‍ය තුළ ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ,
   (1) සන්නිවේදනමය කාර්යයයි
   (2) සංවිධානාත්මක කාර්යයයි
   (3) තොරතුරු සම්පාදන කාර්යයයි
   (4) විනෝදාස්වාදන කාර්යයයි
   (5) මතවාදී කාර්යයයි.
30. පුවත්පත් භාෂාව සඳහා වඩාත්ම ගැලපෙන ආකෘතිය වන්නේ,
   (1) සෑම විටම කෙටි වැකි භාවිතා කිරීම
   (2) පරිකල්පන භාෂා රටාවක් යොදාගැනීම
   (3) සරල හා පැහැදිලි භාෂා ශෛලියක් යොදාගැනීම
   (4) විස්තරාත්මක බවකින් යුක්ත වීම
   (5) අන්තර්ගතයට අනුකූලව ප්‍රකාශනාත්මක භාෂාවක් යෙදීම
31. ගෘහස්ථ සංස්කෘතිය කෙරෙහි විද්‍යුත් ජනමාධ්‍ය පුළුල්ව බලපා ඇත්තේ කෙසේ ද?
   (1) දේශපාලන චර්යාව කෙරේ
   (2) අධ්‍යාපන චර්යාව කෙරේ
   (3) රසවින්දන චර්යාව කෙරේ.
   (4) පාරිභෝජන චර්යාව කෙරේ.
   (5) ආගමික චර්යාව කෙරේ.
32. වෙළඳ දැන්වීම් කරණය, ප්‍රචාරණය හා මහජන සම්බන්ධතාවය හඳුන්වන බඩා නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) ලාභ පරමාර්ථය, ප්‍රතිරූප ගොඩ නැංවීම හා දේශපාලන සහයෝගීතාවය
   (2) ලාභ පරමාර්ථය, දේශපාලන සහයෝගීතාවය, හොඳ හිත
   (3) ජනප්‍රියත්වය, දේශපාලන සහයෝගිතාවය, හොඳ හිත
   (4) ලාභ පරමාර්ථය, හොඳ හිත, පෙළඹවීම
   (5) දේශපාලන සහයෝගීතාවය, හොඳ හිත, පෙළඹවීම
33. සංස්කෘති කාලයත් සමඟ වෙනස් නොවීම,
   (1) සංස්කෘතික සම්පර්කයයි
   (2) සංස්කෘතික ලැග්ම
   (3) සංස්කෘතික රාශි කෘතියයි
   (4) සංස්කෘතික විසරණයයි
   (5) සංස්කෘතික ත්වරණයයි
34. සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පය,
   (1) සංවර්ධන සන්නිවේදන සංකල්පයේ දීර්ඝ වීමකි.
   (2) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
   (3) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ දිගුවකි.
   (4) සමාජ වගකීම් පිළිබඳ සංකල්පයේ දිගුවකි.
   (5) ප්‍රජාතන්ත්‍රීයකරණ සංකල්පයේ දිගුවකි.

The National e-learning Portal for The General Education

35. අසීමාන්තිකව තොරතුරු ගලායාමක් අවශ්‍ය ඕනෑම අවස්ථාවක පරිහරණය කළ යුතු මාධ්‍ය වන්නේ,

(1) පුවත්පතයි (2) අන්තර්ජාලයයි (3) ජංගම දුරකථනයයි
(4) ගුවන්විදුලියයි (5) රූපවාහිනියයි

36. භාෂාවේ සම්මතය හා අසම්මතය අතර වෙනස තීරණය කළ හැක්කේ,

(1) භාෂාවේ ව්‍යාකරණ තුළිනි (2) භාෂාවේ ව්‍යවහාරය තුළිනි.
(3) භාෂාවේ වාග් කෝෂය තුළිනි (4) උප භාෂා ලක්ෂණ තුළිනි.
(5) ඉහත සියල්ල තුළිනි.

37. පොදු ජන සුභ සිද්ධිය අරමුණු කරගෙන සන්නිවේදන හා මාධ්‍ය නිදහස සහ වගකීම රජය විසින් පාලනය කළ යුතු බව කියැවෙන්නේ,

(1) සෝවියට් සමාජවාදී සංකල්පයෙනි (2) නිදහස් මතවාදී සංකල්පයෙනි
(3) සමාජ වගකීම් පිළිබඳ සංකල්පයෙනි (4) අධිපතිවාදී සංකල්පයෙනි
(5) ප්‍රජාතන්ත්‍රීයකරණ සංකල්පයෙනි.

38. භාෂාවේ ඓතිහාසික විකාශනයේදී එකග විය නොහැක්කේ,

(1) භාෂාව බිහිවීම මානව සමාජයේ අවශ්‍යතාවයකි.
(2) අකුරක හැඩය තව දුරටත් වෙනස් වේ.
(3) භාෂාව බිහිවීම නිශ්චිත කාලවකවානුවක් තුළ සිදුවිය.
(4) එක් එක් භාෂාවන් අතර වෙනස්කම් පවතී.
(5) කාලයත් සමඟ අජීවී තත්වයට පත්වූ භාෂා ද වේ.

39. ජනප්‍රිය පුද්ගල චරිත විවිධ වෙළඳ දැන්වීම් වලට යොදාගැනීම ඉතා සුලභව සිදු කෙරේ. ඊට ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) පුද්ගල දක්ෂතා ඇගයීමයි. (2) පුද්ගල දක්ෂතා හඳුන්වා දීමයි.
(3) පුද්ගල ප්‍රතිරූප අලෙවි කිරීමේ ක්‍රියාවලියයි. (4) පුද්ගල ප්‍රතිරූප ගොඩ නැංවීමයි.
(5) පුද්ගල ප්‍රතිරූප ප්‍රසිද්ධ කිරීමයි.

40. මෙවලම් භාවිතය අත්‍යවශ්‍ය සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) ජන සන්නිවේදනය (4) වාචික සන්නිවේදනය
(5) අවිධිමත් සන්නිවේදනය

41. පුරවැසි මාධ්‍යය යනු,

(1) ප්‍රාදේශීය ප්‍රජාව හා සම්බන්ධ ප්‍රවෘත්ති වාර්තා කිරීමයි.
(2) ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනයට වාර්තා කිරීමයි.
(3) ප්‍රජා අයිතිවාසිකම් පිළිබඳ වාර්තා කිරීමයි.
(4) ප්‍රජා සහභාගිත්වය වැදගත් කරුණු වාර්තා කිරීම සඳහා ලබාගැනීමයි.
(5) ප්‍රජාව රාජ්‍ය පාලනය සම්බන්ධව මාධ්‍යය මගින් දැනුවත් කිරීමයි.

42. ජන සන්නිවේදනය සඳහා නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

(1) විශාල පිරිසක් එල්ල කරගත් සන්නිවේදන ක්‍රියාවලියකි.
(2) ඇතැම් අවස්ථාවල දී පමණක් ආයතනගතව පවතී.
(3) නව මාධ්‍ය හා නූතන මාධ්‍ය එයට අයත් වේ.
(4) ග්‍රාහක හා සන්නිවේදක භූමිකා අතර සෘජු සම්බන්ධතාවයක් නොපවතී.
(5) තාක්ෂණික ක්‍රියාවලියක් හා බද්ධව පවතී.

43. ''සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා විසින් අත්පත් කරගනු ලැබූ දැනුම, විශ්වාස, කලාව, සදාචාර, නීතිය, සිරිත් විරිත් සහ අනෙකුත් හැකියාවන් හා පුරුදු ඇතුළත් වූ සංකීර්ණ සමස්තය සංස්කෘතියයි.'' මෙම නිර්වචනය ඉදිරිපත් කොට ඇත්තේ,

(1) රැල්ෆ් ලින්ටන් (2) චාල්ස් ඔස්ගුඩ් (3) මැලිනොව්ස්කි
(4) එඩ්වඩ් ටයිලර් (5) එඩ්වඩ් ෂැපීර්

44. ඥාන ගවේෂණය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ඥාන ගවේෂණය යනු ලෝකය අනාවරණය කර ගැනීමයි.
(2) ඥාන ගවේෂණය යනු ඓතිහාසික ක්‍රියාවලියයි.
(3) ඥාන ගවේෂණය සඳහා විවිධ ශිල්ප ක්‍රම භාවිතා කරයි.
(4) ඥාන ගවේෂණය න්‍යායාධික ගවේෂණයේ ප්‍රතිඵලයක් පමණි.
(5) ඥාන ගවේෂණය බල ක්ෂේත්‍රයට අභියෝගයකි.

45. දෙපාර්ශවයක් අතර ඇති වූ අර්බුදකාරී තත්වයක් නිරාකරණය කර ගත හැකි මූලික විධි ක්‍රමයක් නොවන්නේ,

(1) සාකච්ඡා කිරීම (2) ප්‍රතිගාමී වීම (3) ප්‍රතිසන්ධාන වීම
(4) විනිශ්චය කිරීම (5) මැදිහත් වීම

46. සමාජයේ බල කේන්ද්‍රණයට අභියෝග කළ හැකි වන්නේ,

(1) කලාවට හා ආගමට (2) රාජ්‍යයට හා ජනමාධ්‍යයට
(3) අධ්‍යාපනයට හා ජනමාධ්‍යයට (4) දේශපාලනයට හා ආගම් වලට
(5) රාජ්‍යයට හා වෘත්තිය සමිති වලට

47. භාෂා භාවිතයේ ප්‍රභේදයක් නොවන්නේ,

(1) භාෂණය (2) විවරණය (3) සංජානනය
(4) රූපණය (5) කථනය

48. මූලාශ්‍රයක් ඇත. සම්ප්‍රේෂකයෙකු සිටී. නාලියක් ඇත. අග්‍රස්ථානයක් ඇත. මෙම ආකෘතිය,

(1) ලැස්වෙල් (2) විල්බර් ශ්‍රාම් (3) ශැනොන් වීවර්
(4) බර්ලෝ (5) ඇරිස්ටෝටල්

49. සන්නිවේදනයේ ප්‍රධාන කාර්යයක් නොවන්නේ,

(1) සමාජය තුළ විවිධ මතවාද ගොඩනැගීම
(2) නව තත්වයන්ට අනුගත වීමට පෙළඹවීම
(3) සංස්කෘතිය ඊළඟ පරම්පරාවට ගෙනයාම
(4) ජාතික න්‍යාය පත්‍ර සැකසීමට උදව් කිරීම.
(5) තොරතුරු සම්පාදන කාර්යය

50. සමූහයක් තුළ සන්නිවේදනය කිරීමේ දී එය ඵලදායි වීම සඳහා හේතුවන නිපුණතාවයක් නොවන්නේ,

(1) ආචාරශීලීත්වය (2) වගවීම (3) සහානුභූතිය
(4) විසම්මුතිය (5) සාමූහික වැඩ

$(2 \times 50 = 100)$

e-තක්සලාව The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **තෝරාගත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමිවේ.**

---

01. ''රෝෂිණී, ලබන සතියේ සඳුදා මන්දාකිනීව බලන්න යාළුවො හැමෝම යන්න කැමතියි කිව්වා. ඔයත් එනවා නේද?''

දුරකථනයෙන් එසේ මාව ඇමතුවේ නිර්මලාය.

'' හරි. මමත් එන්නම්.'' මම එසේ පිළිතුරු දුන්නෙමි.

(1) ඉහත සංවාදයේ දී භාවිතා කළ නොහැකි අවාචික සන්නිවේදන විධික්‍රම 03ක් ලියන්න. (ල. 03)

(2) පහත දක්වෙන සන්නිවේදන ආකෘතිය කුමක් දැයි නම් කර, එහි ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන අංග වලට අනුරූපව ඉහත සංවාදය ඇසුරු කර ගනිමින් අංග සඳහන් කරන්න.

S ⟶ M ⟶ C ⟶ R

(ල. 03)

(3) අන්තර් පුද්ගල සන්නිවේදනය යනු කුමක් දැයි එම ප්‍රභේදයට විශේෂිත කරුණු තුනක් ඇසුරෙන් කෙටියෙන් පහදන්න. (ල. 06)

(4) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී වැදගත්ම නිපුණතාවයක් වන ඵලදායී කථනයට අදාළ උපාය මාර්ග 4 ක් දක්වා ඒවා වෙන වෙනම සාකච්ඡා කරන්න. (ල. 08)

02. (1) මාධ්‍ය හා සංස්කෘතිය අතර සම්බන්ධතාවය කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

(2) ජනමාධ්‍ය මගින් සිදුවන අයහපත් බලපෑම අවම කර ගැනීමට භාවිතා කරන ප්‍රධාන ක්‍රම දෙකක් උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල. 06)

(3) සමූහ සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීමට බලපාන නිපුණතා 04 ක් නම් කර, දෙකක් උදාහරණ සහිතව පහදන්න. (ල. 08)

03. (1) සන්නිවේදන සංකල්ප හඳුන්වා දෙන්න. (ල. 06)

(2) සමාජ වගකීම් පිළිබඳ සංකල්පය නිදහස් මතවාදී සංකල්පයට වඩා සමාජ හිතවාදී වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ල. 06)

(3) නූතන ජනමාධ්‍ය භාවිතය තුළ ද අධිපතිවාදී සන්නිවේදන සංකල්පය ඍජුව හා වක්‍රව ක්‍රියාත්මක වේ. විමසන්න. (ල. 08)

04. මහජන සම්බන්ධතාවය සෑම ආයතනයකට මෙන්ම සෑම පුද්ගලයෙකුටම තම සාර්ථකත්වය කෙරෙහි අත්‍යාවශ්‍ය වන්නකි.

(1) නිර්වචනයක් ඇසුරු කොට ගනිමින් මහජන සම්බන්ධතාව හඳුන්වන්න. (ල. 06)

(2) මහජන සම්බන්ධතාව සිදුකරන මෙවලම් හා විධි ලැයිස්තුගත කර ඉන් 04 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(3) ඔබ තෝරාගත් රාජ්‍ය ආයතනයක මහජන සම්බන්ධතා ක්‍රියාවලිය හඳුන්වා දෙන්න. (ල. 08)

05. ජනමාධ්‍ය තුළ භාෂාව භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු රැසකි.

(1) මුද්‍රණ මාධ්‍යයේදී භාෂා භාවිතය පිළිබඳව සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. (ල. 06)

(2) භාෂාවේ ප්‍රභේදයන් නම්කර සරලව හඳුන්වන්න. (ල. 06)

(3) ගුවන් විදුලි මාධ්‍ය සඳහා භාෂාව යොදාගැනීමේදී අවධානයට ගතයුතු කරුණු විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ල. 08)

06. (1) සන්නිවේදනයේ මූලික අරමුණු 04 ක් නම් කරන්න. (ල. 04)

(2) නව මාධ්‍ය හා නූතන මාධ්‍ය යන්න හඳුන්වා ඒවා සතු විශේෂතා දෙක බැගින් හඳුන්වන්න. (ල. 04)

(3) ගෝලීයකරණය ජනමාධ්‍ය වලට ඇති කරන සාධනීය බලපෑම් 03 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 06)

(4) විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය හඳුන්වා ඒවායේ ලක්ෂණ 04 ක් ඇසුරින් විස්තර කරන්න. (ල. 06)

07. (1) සන්නිවේදනය පිළිබඳ එඩ්වඩ් සාපීර් විසින් ඉදිරිපත් කළ නිර්වචනය ලියා දක්වන්න. (ල. 06)

(2) එමගින් සන්නිවේදනය යනු කෙතරම් පෘථුල විෂයයක් ද බව ප්‍රායෝගික උදාහරණ ගෙන සරලව පහදන්න. (ල. 06)

(3) සන්නිවේදනයේ මූලිකාංග හඳුන්වා ඉන් 04 ක් පැහැදිලි කරන්න. (ල. 08)